# ECHO OF HIS CALL

# කැඳවීමේ ප්‍රතිරාවය SINHALA

1969 to 2029 REACHING NATIONS ECHO OF HIS CALL SINCE 1969

**India's National Spiritual Newspaper** ₹ 10/-

Published monthly in ENGLISH, TAMIL, MALAYALAM, TELUGU, HINDI, KANNADA, MARATHI, BENGALI, GUJARATI, ODIYA, ASSAMESE, PUNJABI, NEPALI, URDU, SINHALA & AFRIKAN

**Editor : S. SAM SELVA RAJ** **16 Languages**

Vol. XX YEAR OF OUR LORD JESUS CHRIST, 2026 SEPTEMBER Issue No. 10


## ශුද්ධවූ බයිබලය

**(ගීතාවලිය 103:1-10)**

01. මාගේ ආත්මය, ස්වාමීන්ට ප්‍රශංසා කරව. මා තුළ ඇති සියල්ල උන්වහන්සේගේ ශුද්ධ වූ නාමයට ප්‍රශංසාකරව.

02. මාගේ ආත්මය, ස්වාමීන්ට ප්‍රශංසා කරව, උන්වහන්සේගේ උපකාර සියල්ල සිහිනැති නොකරව.

03. උන්වහන්සේ නුඹේ සියලු අයුතුකම් කමාකරනසේක. නුඹේ සියලු රෝග සුවකරනසේක.

04. නුඹේ ජීවිතය විනාශයෙන් මුදා කරුණාගුණය හා දයාව නැමැති ඔටුන්නෙන් නුඹ සරසනසේක.

05. රාජාලියෙකු මෙන් නුඹගේ යෞවනයකම් අලුත්වන පිණිස උන්වහන්සේ නුඹගේ කට යහපත් දෙයින් තෘප්තියට පමුණුවනසේක.

06. ස්වාමීන්වහන්සේ පීඩා විඳින සියල්ලන් උදෙසා ධර්මිෂ්ඨ ක්‍රියා හා යුක්තිය ඉෂ්ටකරනසේක.

07. උන්වහන්සේ ස්වකීය මාර්ග මෝසෙස්ටත් තමන් ක්‍රියා ඉශ්‍රායෙල් පුත්‍රයන්ටත් දැන්වූසේක.

08. ස්වාමීන්වහන්සේ අනුකම්පාවෙන් හා දයාවෙන් පිරී සිටිනසේක, කෝපවීමට ප්‍රමාදය, අතිශයෙන් කරුණාවන්තය.

09. උන්වහන්සේ නිතර තරවටු නොකරනසේක, සදාකාලයට කෝපය නොපවත්වන සේක.

10. උන්වහන්සේ අපේ පාපවල ප්‍රකාරයට අප කෙරෙහි ක්‍රියා නොකළ සේක. අපේ අයුතුකම්වල ප්‍රකාරයට විපාක නුදුන්සේක.

# මතක තබා ගැනීමට මතක තබා ගන්න !

**REMEMBER TO REMEMBER!**

(සහෝදරී ජෝයි විනා සෑම්)

*"උන්වහන්සේ සමහරුන් ප්‍රේරිතයන්ද සමහරුන් අනාගත වක්තෘවරුන්ද සමහරුන් සුභාරංචිය ප්‍රකාශ කරන්නන්ද සමහරුන් සභා පාලකයන්ද සමහරුන් ගුරුවරුන්ද කොට දුන් සේක." (එපීස 4:11)*



දුරස්තරව වෙසෙන්නාවූ අපගේ කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ පවුලේ සාමාජිකයින්ට අපගේ ස්වාමිවූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ අසිරිමත් වූ නාමයෙන් සුබ පැතුම් ගෙනෙමු!

අපගේ මාසික සඟරාව හරහා ඔබ සැම දෙනා සමග සම්බන්ධ වීමට ලැබීම සැම විටම අපට ඉමහත් සතුටක් සහ වරප්‍රසාදයකි. එම සඟරාව ඔබට ආශිර්වාදයක් වී ඇත්නම් කරුණාකර අප වෙත එය ලියා එවන්න.

ඔබගේ වටිනා යෝජනා සහ ප්‍රතිචාර නිසා අපේ ඔබට ස්තුතිවන්ත වෙමු.

සුභ ගුරු දිනයක් වේවා!

අපට ඉගැන්වූ සහ බලපෑම් කළා වූ අයව සිහිපත් කිරීම!

මතු පරම්පරාවේ මනස් ආලෝකමත් කිරීම සඳහා තම ජීවිතය කැප කළාවූ සියලුම ගුරුවර ගුරුවරියන්ට සුභ ගුරු දිනයක් වේවා!

*"උන්වහන්සේ සමහරුන් ප්‍රේරිතයන්ද සමහරුන් අනාගත වක්තෘවරුන්ද සමහරුන් සුභාරංචිය ප්‍රකාශ කරන්නන්ද සමහරුන් සභා පාලකයන්ද සමහරුන් ගුරුවරුන්ද කොට දුන් සේක." (එපීස 4:11)*

දෙවියන්වහන්සේ විසින් අපට දෙන පළමු ගුරුවරුන් අපගේ දෙමව්පියන් බව මම සැබවින්ම විශ්වාස කරමි. එසේම ජීවිතයේ පළමු පාඩම් පාඩම අපට උගන්වන සහ අපගේ පළමු පියවර මෙහෙයවන්නාවූ අයද ඔවුන්ය.

ඉන්දියාවේ සෑම වසරකම සැප්තැම්බර් මස 5 වන දින ගුරු දිනය සමරනු ලබන අතර, ගුරුවරුන් ඉහළින් අගය කළ යන අනාගත පරපුරේ මනස හැඩගැස්වීමේදී

3 වෙනි පිටුවට ...


**Echo of His Call**

**Christian YouTube Channel!**



Every day 2 minutes message by

**Pr. S. Sam Selva Raj!**

in English, Hindi Language - 1.00 A.M.,
in Tamil & Telugu Language - 2.00 A.M.

**and**

Tamil & English Message & Prayer

**Sunday 8.30 A.M. & 6.00 P.M.**

**Please Subscribe if you are blessed! Share with whom you love & care!!**



# ECHO OF HIS CALL - (Marching towards 60th year)

Estd. 1969

## from your dearly beloved brother...

"..මම ඔවුන්ගේ දේශය සුව කරන්නෙමි." (2 ලේකම් 7:14)



**OUR MISSION POLICY**

We should expound and teach the contemporary generation the undiluted teachings of the ancient and early Apostles. It is the need of the hour.


**HON. EDITOR-IN-CHIEF**

Rev. Dr. Angeline S. Kumari, M.A., M.Sc., M.Ed.

**EX MANAGING EDITOR**

Pastor Alex Samson Sam, B.Th., M.Div.

**GENERAL MANAGER**

Bro. N. Prakasam, M.A., M.Sc.(C&P), PGDHRM, MBA.

**ADMINISTRATION**

Sis. Jesy Veena Sam
Adv. K. Puratchivendan, M.Com., C.A., B.L.
Dr. P.E.R. Premchand, M.Sc., M.A., M.Ed., Ph.D.
Dr. C.G.S. Baburao, B.Tech., M.Tech. (DM), Ph.D.
Dr. Rabinder Boaz, M.S. (CMC)

**EDITORIAL BOARD**

Sis. Sajini Cherian
Rev. Dr. J. John Rajarathnam, B.E.S., B.D., M.Th.
Rev. Dr. K.R. Rajasekaran
Adv. N. Balaji, B.Com., M.L.



**EDITOR, PUBLISHER & PRINTER**

Pastor S. SAM SELVA RAJ
Echo of His Call Printers
10, Mohammed Abdullah 2nd Street,
Chepauk, Chennai- 600 005, India.
Phone : (+ 91- 44) 2852 8282, 2852 9293
Cell : (+91) 98410 71852, 98412 71858

**E.MAIL**

sam@echoofhiscall.org
biblecor@yahoo.co.in

**WEBSITES**

www.echoofhiscall.org
www.stpaulsmatriculation.org

**YOUTUBE CHANNEL**

Echo of His Call


ස්වාමින්වහන්සේ තුළ ප්‍රිය ප්‍රේමවන්තයෙනි,

අපගේ ස්වාමීන් හා ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ අසමසම නාමයෙන් ඔබ සැමට සුභ පැතුම් ගෙනෙමු!

දෙවියන්වහන්සේගේ බලවත් කරුණාවෙන් අගෝස්තු මස 10වන දින අපගේ දේව සේවය 58වන වසරට පා තැබුවෙමු. අගෝස්තු 8,9 සහ10 යන දිනයන් වලදී අපගේ සභාවෙහි පැවති විශේෂ අධ්‍යාත්මික රැස්වීම්වලදී උන්වහන්සේගේ බලවත් ආශිර්වාද ගැන අප ස්වාමීන් වහන්සේට ස්තූති ප්‍රශංසා කළෙමු. වසර ගණනාවක් පුරා අප සමග විශ්වාසවන්තව සිටිමින් මෙම සේවයේ හවුල්කරුවන් වූ ඔබ සැමටද අප බෙහෙවින් කෘතඥ වෙමු. ඔබගේ ප්‍රේමය, යාච්ඤා සහ නොසැලෙන සහයෝගය නිසා ස්වාමින්වහන්සේ ඔබ සැමටද බහුල ලෙස ආශිර්වාද කරන සේක.

ජූලි මස 5වන දින දී; නෙහෙමියා බයිබල් විද්‍යාලයේ (දේවධර්ම ඩිප්ලෝමා) උපාධිධාරිණියක් සහ දැන් චෙන්නයි හි එන් නෝර් ප්‍රදේශයේ ස්වාමින්වහන්සේට සේවය කරන සහෝදරී ජේ. වික්ටෝරියා, ඇගේ පුත් ජේ. අන්බුරාජ් ශිෂ්‍යයකු ලෙස ඇතුලත් කර ගැනීම සඳහා විද්‍යාලයට පැමිණියාය.



මෙම වටිනා නැවත හමුවීම අපගේ හදවත් කෘතඥතාවයෙන්, ප්‍රීතියෙන් සහ අලුත් දිරිගැන්වීමකින් පිරෙව්වේය. හිටපු ශිෂ්‍යයෙක් ස්වාමීන් වහන්සේට විශ්වාසවන්තව සේවය කරමින් දැන් ඊළඟ පරම්පරාව දේව සේවය සඳහා පුහුණු කිරීමට ගෙන ඒම දැකීම දෙවියන් වහන්සේගේ විශ්වාසවන්ත භාවයට අපූරු සාක්ෂියකි. වික්ටෝරියා සහෝදරියගේ සාක්ෂියේ සාරාංශයක් පහත දැක්වේ.

දෙවියන් වහන්සේගේ කරුණාවෙන් 2011 - 2012 අධ්‍යයන වර්ෂයේදී, නෙහෙමියා බයිබල් විද්‍යාලයේ, කැඳවීමේ ප්‍රතිචාරය සේවය යටතේ ඉගෙනීමේ වරප්‍රසාදය මට ලැබුණි. පළමු දිනයේ සිටම බයිබලය හුදෙක් අධ්‍යයනය කළ යුතු පොතක් නොව දිනපතා කීකරු වී ජීවත් විය යුතු දෙවියන්වහන්සේගේ ජීවමාන වචනය බව මම ඉගෙන ගතිමි. මට ලැබුණු පුහුණුව දෙවියන් වහන්සේගේ කැමැත්ත වටහා ගැනීමට සහ උන්වහන්සේට විශ්වාසවන්තවත් කීකරුවත් ගමන් කිරීමටද මට උපකාරී විය.

බයිබල් විද්‍යාලය විසින් ලබාදුන් ඉතා හොඳ බයිබලානුකූල ඉගැන්වීම් සහ දේව ප්‍රතිපත්ති මගේ අධ්‍යාත්මික ජීවිතය සහ දේව සේවයට ශක්තිමත් පදනමක් බවට පත්විය. එම වටිනාකම් මා තුළ යාච්ඤාව, විනය, නිහතමානිකම, අඛණ්ඩතාව, වෙලාවට වැඩ කිරීම සහ දේව සේවය


Our Ministries: ECHO OF HIS CALL Monthly Magazines (16 languages) BIBLECOR - Postal Courses (3 languages) YouTube Ministry Online Courses Theological Correspondence Courses (2 languages) Church Planting Nehemiah Bible Colleges Gospel Printing Press Great Commission Partners St. Paul's Matriculation School Crusades Community Development

සඳහා ඉතා පැහැදිලි දැක්මක් ඇති කළේය. අදටත් ස්වාමීන් වහන්සේට කරන සේවයේදී උන්වහන්සේ මාව දිගටම ශක්තිමත් කරමින් මග පෙන්වන්නේය.

මෙම ආයතනය හරහා මගේ ජීවිතය හැඩ ගැස්වීම ගැන මා දෙවියන්වහන්සේට මුළු හදවතින්ම ස්තුතිවන්ත වෙමි. මගේ ළපුණුව පුරාම මා වෙනුවෙන් ආදරයෙන් ඉගැන්වූ මග පෙන්වූ දිරිමත් කලා වූ සහ යාච්ඤා කළ පීඨයට සහ පරිපාලනයට මම බෙහෙවින් කෘතඥ වෙමි. උන්වහන්සේගේ කැඳවීමේ ප්‍රතිරාවය දේව සේවයෙන් තවත් බොහෝ තරුණ තරුණියන් දෙවියන් වහන්සේගේ රාජ්‍යය සඳහා සන්නද්ධ කිරීමටත් ඔවුන් පොළවේ ලුණු සහ ලෝකයේ ආලෝකය වීමටත් ඔවුනව මසවා තැබීමටත් උපකාර වේවා කියා මා අවංකවම යාච්ඤා කරමු.

සහෝදරී වික්ටෝරියා

ඔබගේ අවංක, අඛණ්ඩ, ප්‍රේමය, විශ්වාසවන්ත යාච්ඤා සහ ත්‍යාගශීලී සහයෝගය වෙනුවෙන් අපගේ සියලුම පාඨකයින්ට සහ කැඳවීමේ ප්‍රතිරාවය සේවයේ පවුලේ සෑම සාමාජිකයකුටම අපගේ හෘදයාංගයම ස්තුතිය පුද කරමු. ඔබගේ හවුල්කාරිත්වය නිසා අපට ශුභාරංචිය දිගටම ප්‍රකාශ කරගෙන යාමට සහ දෙවියන්වහන්සේගේ සේවය සඳහා ඇදහිලිවන්තයින්ව සන්නද්ධ කිරීමට හැකියාව ලබාදෙයි. අපගේ ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ බලවත් කරුණාව, සාමය සහ ආශීර්වාදය ඔබ සැමට වේවා ආමෙන්!

*In Christ Jesus, your servant,* ***Pr. S. Sam Selva Raj***

E.mail : sam@echoofhiscall.org

1 පිටුවෙන්....

ඔවුන් ඉටු කරන අතිශය වැදගත් කාර්යභාරය හඳුනාගත්, ඉන්දියාවේ දෙවන ජනාධිපති ආචාර්ය සර්වේපල්ලි රාධාක්‍රිෂ්ණන්ගේ ජන්ම සංවත්සරය සමරයි.

අප අතරින් කීදෙනෙක් තවමත් අපගේ පාසලේ ගුරුවරුන් මතක තබාගෙන සිටිනවාද කියා කල්පනා කරමි. ඒ අතර ඉරුදින පාසලේ ගුරුවරුන් සහ බයිබල් විද්‍යාලයේ කථිකාචාර්යවරුන්ද සිටි, වඩාත්ම වැදගත් කාරණය නම්; අපගේ ප්‍රාථමික පාසලේ ගුරුතුමිය අපගේ අත අල්ලාගෙන පැන්සලෙන් මුල් අකුර ලියවීම සහ මුල්ම ඉලක්කම ගණන් කිරීමට අපට කියා දුන්නේය.

කාලය ගතවීමත් සමගම අප අද සිටින්නාවූ ස්ථානයට

නැගීමට අපට උපකාරී වූ ඉනිමග බොහෝ විට අප අමතක කරමු.

මගේ මව ජෙයශීලි සෙල්වන් මහත්මිය වසර 32ක් ප්‍රාථමික පාසල් ගුරුවරියක් ලෙස සේවය කළාය. ඇය අපගේ ප්‍රදේශයේ පරම්පරා ගණනාවක දරුවන්ට සියලුම අධ්‍යයන විෂයන් ඉගැන්වූවාය. ඇය ස්වාමීන් වූ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස් වහන්සේව අපට හඳුනා දුන් අපගේ ඉරිදා පාසලේ ගුරුතුමියද වූවාය.

ඇය අධ්‍යාපනඥවරියක් පමණක් නොව බොහෝ දරුවන්ට ඔවුන්ගේ තරුණ ජීවිතයේදීම ලෞකික අධ්‍යාපනය සහ අධ්‍යාත්මික ජීවිතය යන දෙකෙහිම බොහෝ දරුවන්ට ස්වාමීන් වන යේසුස් ක්‍රිස්තුස් වහන්සේ හඳුන්වාදීමට ඇය මෙවලමක් වූවාය.

ඇය අපගේ කැඳවීමේ ප්‍රතිරාවය ප්‍රධාන සභාවේ පළමු සබත් පාසල් ගුරුවරියද වූවාය. අපගේ වර්තමාන සභාවේ නායකයින් සහ සහකාර දේව ගැතිවරුන් බොහෝ දෙනකු පෝෂණය කර ඇති දැඩි කරන ලද්දේ ඇය හරහාය.

ඇගේ ජීවිතය ගැන මා දෙවියන් වහන්සේට ස්තුතිවන්ත වන අතර අපගේ ස්වාමීන් සහ ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කෙරෙහි ඇයගේ නොසැලෙන ඇදහිල්ල මා ඉතාමත් ගෞරවයෙන් සිහිපත් කරමි.

**මතක තබා ගැනීමට මතක තබා ගන්න!**

බයිබලය නැවත නැවතත් අපට මතක තබා ගැනීමට උනන්දුවයි. අප වෙනුවෙන් මහත් දේ කළ ස්වාමීන්වහන්සේව සිහි කරන්න.

අමතක වීම යනු සැම විටම මතකයේ සරල අසමත් වීමක් නොවෙයි. බයිබලය එය වඩා වඩාත් බරපතල දෙයක් දෙයක් ලෙස ඉදිරිපත් කරයි. කෘතඥ වීම අතිශයින්ම වැදගත් වන්නේ; ශුද්ධ ලියවිල්ලේ සඳහන් නිහඬම නමුත් භයානකම පාපය අමතක වීමේ පාපය ලෙසයි.

අප බොහෝවිට පාපය ගැන සිතන්නේ; පැහැදිලි කැරැල්ලක්, කෝපයක්, වංචාකමක්, දුරාචාරයක් හෝ උඩඟුකමක් ලෙසයි. නමුත් බයිබලය අපට වඩාත් සියුම් හදවතේ තත්ත්වයක් ගැන අනතුරු අඟවයි. එනම්; දෙවියන්වහන්සේව අමතක කිරීම සහ උන්වහන්සේගේ යහපත්කම අමතක කිරීමයි.

*දෙවියන්වහන්සේගේ වචනය අපට අනතුරු අඟවමින් මතක් කරයි: (ද්විතීය කතාව 6:12)*

*"...... ස්වාමීන් වහන්සේ සිහි නැති නොකරන්ට බලා ගනින්න." (ද්විතීය කතාව 8:2)*

*".......... මේ සතලිස් අවුරුද්දේ කාන්තාරයෙහි තුඹ ගෙනගිය මුළු මාර්ගය සිහිකරපන්න." (ගීතාවලිය 103:2)*

*"මාගේ ආත්මය, ස්වාමීන්ට ප්‍රශංසා කරව, උන්වහන්සේගේ උපකාර සියල්ල සිහි නැති නොකරව. (1 ලේකම් 16:13)*

*"උන්වහන්සේ කළ පුදුම ක්‍රියාද උන්වහන්සේගේ ආශ්චර්යයන්ද උන්වහන්සේගේ මුඛයේ විනිශ්චයයන්ද සිහිකරව." (ගීතාවලිය 77:11-12)*

"ස්වාමීන්ගේ ක්‍රියා සඳහන් කරන්නෙමි; මක්නිසාද ඔබගේ පුරාණ ආශ්චර්යයන් සිහිකරන්නෙමි. ඔබගේ කර්මාන්ත සියල්ල ගැන භාවනා කරන්නෙමි. ඔබගේ ක්‍රියා ගැන මෙනෙහි කරන්නෙමි කීයෙමි."

අමතක වීම යනු හුදෙක් මතකයේ අසාර්ථකත්වයක් නොවේ. එය කෘතඥතාවයේ අසාර්ථකත්වයක් වියහැකිය.

යම් පුද්ගලයෙක් ආශීර්වාදය භුක්ති විඳින නමුත් ආශීර්වාදයේ උල්පත නොසලකා හරින විට එය සිදුවේ. යමෙකු කරුණාව ලැබුවද ඔවුන්ට දක්වන ලද කරුණාව පිළිගැනීමට අපොහොසත් වූ විට එය සිදුවෙයි. එය සිදුවන්නේ මිනිසුන් අද සිටින තැන සමරන අතර ඔවුන්ට එහි යාමට උදව් කළ අයගේ කැපකිරීම්, යාච්ඤා සහ විශ්වාසවන්තභාවය අමතක කරන්න දමන නිසාය.

බයිබලය පුරාම අන් අයගේ යහපත්කම නිසා ආශීර්වාදය ලබාගත් නමුත් එය මතක තබා ගැනීමට අපොහොසත් වූ පුද්ගලයින්ව අපට හමුවේ. ඔවුන්ගේ කතා පුවත් වාර්තාකර ඇත්තේ, ඔවුන් විවේචනය කිරීමට පමණක් නොව එය ලියා ඇත්තේ අපටද අනතුරු ඇඟවීමක් ලෙසය.

අප අපගෙන්ම ඇසිය යුතු ප්‍රශ්නය නම්;

අප දෙවියන් වහන්සේගේ ආශීර්වාදය භුක්ති විඳින අතර, අපට ආශීර්වාදයක් වීමට දෙවියන්වහන්සේ විසින් පාවිච්චි කළා වූ මිනිසුන්ව අප අමතක කර දමා තිබේද?

## අමතක වූ අනුග්‍රහය: යෝසෙප් සහ කුසලාන දරන්නා (උත්පත්ති 40-41)

යෝසෙප්ගේ ගමන් මාර්ගය ප්‍රතික්ෂේප කිරීම් සහ බලාපොරොත්තු සුන්වීම් වලින් පිරී තිබුණි. ඔහුගේම සහෝදරයන් ඔහුව පාවාදී වහල් භාවයට විකුණා ඔහුගේ පවුලේ සැප පහසුව ඔහුගෙන් වෙන් කළේය. නමුත් ඊජිප්තුවේදී පවා දෙවියන්වහන්සේ යෝසෙප් සමග සිටියේය.

පෝතිපර්ගේ බිරිඳ විසින් බොරු චෝදනා එල්ල කිරීමෙන් පසු යෝසෙප්ව සිරගෙට දමන ලදී. එහිදී පවා දෙවියන්වහන්සේ ඔහුට අනුග්‍රහය දැක්වූ අතර සිහින තේරුම් කරදීමේ හැකියාවද ඔහු තුළින් ක්‍රියාත්මක කළේය.

දිනක් පාරාවෝගේ කුසලාන දරන්නා සහ පූප සාදන්නා යෝසෙප් සමග සිරගත කරනලදී. මෙම දෙදෙනාම සිහිනයන් දුටු අතර දෙවියන් වහන්සේගේ ප්‍රඥාව තුළින් යෝසෙප් ඒවායේ අර්ථය ඔවුන් හට පැහැදිලි කළේය. යෝසෙප් ඔවුන්ට තේරුම් කියා දුන් ලෙස කුසලාන දරන්නා පාරාවෝගේ මාලිගාවේ ඔහුගේ ස්ථානයට නැවත පත් කරන ලදී.

කුසලාන දරන්නා නිවසට යාමට සූදානම් වන විටදී යෝසෙප් ඔහුගෙන් ඉල්ලීමක් කළේය.

*"ඉතින් නුඹට ශුභසිද්ධ වූ කල්හි මා සිහි කොට මට කරුණාව පෙන්වා....." (උත්පත්ති 40:14)*

යෝසෙප් ඔහුගෙන් කාසියක් ඉල්ලා සිටියේ නැත. ඔහු ඉල්ලා සිටියේ ඔහුව මතකයේ තබා ගන්නා ලෙසයි.

නමුත් බයිබලය වේදනාකාරී යථාර්ථයක් වාර්තා කරයි.

*"එසේවී නුමුත් කුසලාන දරන්නාගේ නායකයා යෝසෙප් සිහිනොකොට ඔහු මතක නැතිකෙළේය." (උත්පත්ති 40:23)*

පාතුවාරියා පුවපහසු තත්ත්වයට පත් වුවද, ජෝසප් දිගටම සිරගෙයි රැඳී සිටියේය. බලාපොරොත්තුවක් ලැබූ මිනිසා, දෙවියන් වහන්සේ විසින් තමාට බලාපොරොත්තුවක් ලබාදීමට පාවිච්චි කළ මිනිසාව අමතක කළේය.

සමහර විට මනුෂ්‍යයන් තමන්ට දක්වන කරුණාව අමතක කරනු ලබන්නේ; ඔවුන් ආශීර්වාද වලින් පූර්ණ වන බැවිනි. කුසලාන දරන්නා කට්ටුරටක් සිරගෙදර නොසිටි අතර සමහර විට ඔහුගේ අතීතයේ වේදනාව ඉක්මනින් මැකී ගියේය. යෝසෙප්ගේ දුක් වේදනාවලට වඩා ඔහුට ඔහුගේ නිදහස වැදගත් විය.

නුමුත් මිනිස් අමතක වීම් සිදු වෙනු ලැබුවත් දෙවියන් වහන්සේගේ විශ්වාසවන්තකම කිසි දිනෙක අවලංගු වන්නේ නැත.

තව අවුරුදු දෙකක් යෝසෙප්ව මිනිසුන්ව අමතක වී තිබුද දෙවියන් වහන්සේ ඔහුව කිසිදාක අමතක කළේ නැත. ආමෙන්!

නියමිත කාලයේදී දෙවියන්වහන්සේ: කිසිම මිනිසෙකුට වසා දැමිය නොහැකි දොරක් විවෘත කළේය. යෝසෙප් එක දවසකින් සිර ගෙදරින් මාලිගාවට ගියේය.

ප්‍රිය සහෝදර සහෝදරිය, මෙම කතාව අපට මතක් කර දෙන්නේ මිනිසුන් අපව මතක තබා ගන්නවාද නැතහොත් අප කළ දේ හඳුනා ගන්නවාද යන්න මත අපගේ වටිනාකම මැනිය යුතු නැති බවයි. අපගේ විපාකය ලැබෙන්නේ මිනිස් පිළිගැනීමෙන් පමණක් නොවේය.

දෙවියන්වහන්සේගේ සෑම කරුණාවන්ත ක්‍රියාවක්ම, සෑම පරිත්‍යාගයක්ම සහ විශ්වාසවන්තකමේ සෑම මොහොතක්ම දකියි.

### ධෛර්යමත් වෙන්න!

*"............ එවිට රහසින් දකින නුඹේ පියාණන් වහන්සේ නුඹට විපාක දෙන සේක." (මතෙව් 6:6)*

### නමුත් මෙම කතාව අපට අභියෝග කරයි;

* අපගේ ගමනේදී අපට අමතක වී ඇති විටදී අපට උපකාර කළේ කවුද?
* අප අරගලයන් තුළ සිටින විටදී අප වෙනුවෙන් යාච්ඤා කරනු ලැබුවේ කවුද?
* අපට අත්හැර දමන්නට අවශ්‍ය වූ විටදී අපට දිරිමත් කළේ කවුද?

සෑම දිනකදීම අප අපගේ ආශීර්වාදයන් මතක තබාගන්නා ආකාරයෙන්ම අපගේ බර උසුලන්නට උදව් කළා වූ අය අමතක කරන මිනිසුන් බවට පත් නොවෙමු.

## අමතක වූ පියා: යෝවාෂ් සහ යෙහෝයාදා! (2 ලේකම් 24)

යෝවාෂ් රජුගේ කතාව අමතක වූ විශ්වාසවන්තභාවය පිළිබඳ ප්‍රබල වූ උදාහරණයකි.

යෝවාෂ් යුදාහි රජ වූයේ ඔහුට වයස අවුරුදු හතේදිය. ඔහුගේ දිවි ගලවා ගැනීම ආශ්චර්යමත් දෙයකි. මන්ද ඔහුගේ ආච්චිවූ අතලියා රාජකීය පවුල විනාශ කිරීමට උත්සාහ කළ අවස්ථාවේදී යෝවාශ්ව ගිරාගෙන දේව මාලිගාවේ සඟවා තබන ලදී.

ඔහුව ආරක්ෂා කරනු ලැබුයේ පූජක වූ යෙහෝයාදාය. යෙහෝයාදා යෝවාෂ්ගේ ජීවිතය බේරා ගැනීමට වඩා වැඩි යමක් කළේය. ඔහු ඔහුට මග පෙන්විය. දෙවියන් වහන්සේගේ මාර්ගය ඔහුට ඉගැන්වූ අතර යුදාහි සැබෑ නමස්කාරය නැවත පිහිටුවීමට උදව් කරනු ලැබුවේය. යෙහෝයාදා ගේ නායකත්වය යටතේ යෝවාෂ් ස්වාමින් වහන්සේගේ ඇස් හමුවෙහි හරි දේ කළේය.

දෙවියන් වහන්සේගේ මෙම විශ්වාසවන්ත සේවකයාගේ ප්‍රඥාව සහ ආත්මික මග පෙන්වීම මත යෝවාෂ් වසර ගණනාවක් ප්‍රයෝජනය ලැබුවේය. නමුත් යෙහෝයාදා මියගියාට පසු සියල්ල වෙනස් විය.

....Contd. to page 6




**ඉතා හදිසි දැනුම් දීමක්!**

ඉදිරියේදී කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව තැපැල් මගින් යැවීමේදී නොවැළැක්විය හැකි බාධාවන් ඇතිවීමට හැකිය. එබැවින් ඔබට කිසිඳු බාධාවකින් තොරව කැඳවීමේ ප්‍රතිරාවය සඟරාව දිගටම ලබා ගැනීමට අවශ්‍ය නම්, කරුණාකර ඔබගේ නම, ලිපිනය, විද්‍යුත් තැපැල් සහ whatsapp අංකය සඳහන් කර ලිපියකින්, විද්‍යුත් තැපෑලෙන්, දුරකථන ඇමතුමකින් හෝ sms / Whatsapp පණිවිඩයක් හරහා ඉක්මනින්ම අප වෙතට ලැබෙන්නට සලස්වන්න.

ඔබගේ සහයෝගය අපට ඔබට හොඳින් සේවය සලසා දීමට උපකාරී වෙයි!

අපගේ ලිපිනය:

ECHO OF HIS CALL,
10, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005, India
Cell: (+91) 98412 71858 / 98410 71858 E.mail: mm@echoofhiscall.org

GREAT COMMISSION PARTNERS
ECHO OF HIS CALL MINISTRIES
SINCE 1988

# යාච්ඤා පංගුකාර සේවයේ අයට යාච්ඤා ඉල්ලීම්

**බෙදා ගැනීම (ගලාති 6:2)**
**උපකාර කිරීම (රෝම 12:13) සහ**
**පුබුදු කිරීම (2 තිමෝති 1:6)**

## ස්තූති දීම හා ප්‍රසංශා කළ යුතු කරුණු

**සැප්:19 -** අපගේ මිෂනාරි සේවකයින්ගේ ඉමහත් කැපවීම සහ විශ්වාසවන්ත සේවය නිසා, ස්තූති කරන්න.

**සැප්:20-** අපගේ යාච්ඤා හවුල්කරුවන්, දායක හවුල්කරුවන්, ඇඳහිල්ලේ හවුල්කරුවන්, ජීවිත කාලය පුරා හවුල්කරුවන්, මහා නියෝගයේ හවුල්කරුවන් සහ ඔවුන්ගේ පවුල් වලට උන්වහන්සේගේ කරුණාව තබා තිබෙන නිසා, ස්තූති කරන්න.

**සැප්:21 -** අපගේ ප්‍රධාන සභාවට පැමිණි නව ඇදහිලිවන්තයින්ගේ ජීවිතය තුළ කර තිබෙන ආශිර්වාදයන් නිසා, ස්තූති කරන්න.

**සැප්:22-** අපගේ ප්‍රධාන සභාවේ සහ ශාඛා සභාවන් වල ඉරුදින නමස්කාර සේවය හරහා දෙවියන් වහන්සේගේ වචනයේ බලය ක්‍රියාත්මක වන නිසා, ස්තූති කරන්න.

**ජූනි:23 -** අපගේ මුද්‍රණාල සේවය අඛණ්ඩව කරගෙන යාමට හැකි වූ නිසා සහ එහි සේවකයින් කැපවී සේවය කළ නිසා, ස්තූති කරන්න.

**සැප්:24-** අපගේ කැඳවීමේ ප්‍රතිරාවය You-tube නාලිකාව හරහා විනාඩි 2ක පණිවිඩය තුළින් බොහෝ ජීවිත පරිවර්තනය වී ලැබුණු සාක්ෂි නිසා, නිසා ස්තූති කරන්න.

**සැප්:25-** ශාන්ත පාවුලු මෙට්‍රිකියුලේෂන් පාසල, නෙහෙමියා බයිබල් විද්‍යාලය සහ අපගේ තැපැල් මාර්ගික බයිබල් පාඨමාලාව සඳහා උන්වහන්සේ ආශිර්වාද කළ නිසා, ස්තූති කරන්න.

**සැප්:26-** කැඳවීමේ ප්‍රතිරාවය, සඟරා සේවයට විශ්වාසවන්තව සහාය දැක්වූ, කැපවූ සහකාර සංස්කාරකවරුන් සහ එයට උපකාර කළ සියලු දෙනා නිසා, ස්තූති කරන්න.

**ජූනි:27-** අපගේ විවිධ සේවාවන් හරහා සුභාරංචිය ප්‍රකාශ කිරීමට නොපැලී කැපවීම් කළා වූ අපගේ ජ්‍යෙෂ්ඨ පාලකතුමා සහ ඔහුගේ පවුලේ අයට දිව්‍ය ආරක්ෂාව, යහපත් සෞඛ්‍යය හා ශක්තියක් ලැබී තිබෙන නිසා, නිසා ස්තූති කරන්න

**සැප්:28-** නෙහෙමියා බයිබල් විද්‍යාලයේ උපාධි ප්‍රධානෝත්සවය අති උත්කර්ෂවත්ව හා ආශිර්වාදලත් ආකාරයෙන් පැවැත්වීමට අපට හැකියාව ලබා දුන් නිසා, නිසා ස්තූති කරන්න

**සැප්:29 -** අපගේ සේවාවන් වලදී යොදාගත් වාහන සහ රියදුරන්ට ආරක්ෂාව ලබාදුන් නිසා සහ අපගේ රෝහල් සේවය හරහා බලවත් හාස්කම් සිදුකළ නිසා, ස්තූති කරන්න.

**සැප්:30-** අපගේ තරුණ සහ ළමා සේවයේ ගෝලීය දැක්මට ආශිර්වාද කර තිබෙන නිසා, ස්තූති කරන්න.

**ඔක්:01-** ලොව පුරා වෙසෙන සියලුම දූ දරුවන් සහ වැඩිහිටියන්ට දෙවියන්වහන්සේගේ කරුණාව ලැබෙන පිණිස ස්තූති කරන්න, ස්තූති කරන්න.

**ඔක්:02** ලොව පුරා වෙසෙන සියලුම ජාතීන් වෙත්ව සුභාරංචිය ගෙන යාමට දෙවියන් වහන්සේ විවිධ දොරටු විවෘත කර තිබෙන නිසා, ස්තූති කරන්න.

**ඔක්:03-** ශ්‍රී ලංකා දේශය තුළ සුභාරංචිය ගෙන යාමට සාමකාමී වාතාවරණයක් ලබා දී තිබෙන නිසා, ස්තූති කරන්න.

## යාච්ඤා කිරීම් සඳහා කරුණු

**ඔක්:04-** අපගේ නෙහෙමියා බයිබල් විද්‍යාලයේ සියලුම සිසුන්ට දිව්‍ය ආරක්ෂාව ලැබෙන පිණිස, යාච්ඤා කරන්න.

**ඔක්:05-** අපගේ දේව සේවයේ සියලුම මූල්‍යමය අවශ්‍යතා දෙවියන්වහන්සේගේ ආශිර්වාදය තුළ සපුරාලන පිණිස, යාච්ඤා කරන්න.

**ඔක්:06-** ලොව පුරා සිටින සියලුම තිතුණු හා තිතුනු නොවන ගුරුවර ගුරුවරියන්ට දෙවියන්වහන්සේගේ පෙන්වීම තුළ සෑම ජීවිතයකම බලපෑමක් ඇතිවන පිණිස ඉගැන්වීමේ කටයුතු කරන පිණිස, යාච්ඤා කරන්න.

**ඔක්:07-** අපගේ සියලුම සේවාවන්වල අඛණ්ඩ වර්ධනය සහ ව්‍යාප්තිය නිසාත් සුභාරංචිය හරහා තවත් බොහෝ මනුෂ්‍යයන් වෙත ළඟා වීමට හැකියාව ලබාදෙන පිණිසත්, යාච්ඤා කරන්න.

**ඔක්:08-** අපගේ සේවයට සහාය වන සියළු දෙනා සහ ඔවුන්ගේ පවුල්වලට ආරක්ෂාව හා සැපයීම ලැබෙන පිණිස, යාච්ඤා කරන්න.

**ඔක්:09-** අපගේ ජ්‍යෙෂ්ඨ දේවගැති තුමා වන එස්.සෑම් සෙල්ව රාජ් සහ ඔහුගේ පවුලේ සියලු දෙනා නපුරු බලවේගයන්ගෙන් සහ අනතුරුවලින් දිව්‍ය ආරක්ෂාව ලැබෙන පිණිස, යාච්ඤා කරන්න.

**ඔක්:10-** ලොව පුරා වෙසෙන සියලු මනුෂ්‍යයන් තුළ පවතින යුද බිය සහ නොසන්සුන්තාවයන් නොව මිදී දෙවියන් වහන්සේගේ සාමය, සමගිය ආරක්ෂාව සහ ස්ථාවරත්වය ඇතිවන පිණිස,යාච්ඤා කරන්න.

**ඔක්:11 -** ලොව පුරා තිබෙන ආර්ථික අර්බුදය ඉවත්වී දුක් විඳින ජනයාහට සහනය සහ බලාපොරොත්තුව ලැබෙන පිණිසත් ඔවුන්ගේ මූලික අවශ්‍යතාවයන් සඳහා දෙවියන්වහන්සේගේ සැපයීම ලැබෙන පිණිසත්, යාච්ඤා කරන්න.

**ඔක්:12-** ලොව පුරා සිටින සියලුම පාලකයින්ට දෙවියන් වහන්සේගේ ප්‍රඥාව ලැබෙන පිණිසත් සෑම රටකම සියලු අංශවලින් සංවර්ධනය වන පිණිසත්, යාච්ඤා කරන්න.

**ඔක්:13 -** සෑම රටකම සිටින ආරක්ෂක (ගොඩබිම, මුහුදු, ගුවන්) නිලධාරීන්ගේ ආරක්ෂාව පිණිස, යාච්ඤා කරන්න.

**ඔක්:14-** ලොව පුරා සිටින සියලුම පාසල් දරුවන්ගේ අධ්‍යාපනය, පෝෂණය ආරක්ෂාව හා රැකවරණය උදෙසා, යාච්ඤා කරන්න.

**ඔක්:15--** දේව රාජ්‍යය පොළොව මත ගොඩනැගීමට වෙහෙසෙන්නාවූ අපට උන්වහන්සේගේ බලවත් දැනගැනීමක්, ප්‍රඥාවක් හා ශුද්ධාත්ම මග පෙන්වීම ලබා දෙන පිණිස, යාච්ඤා කරන්න.

**ඔක්:16--** ලොව පුරා තිබෙන සිරගෙවල්හි සිටින සිරකරුවන්ගේ ගැලවීමක් එහි සිටින නිලධාරීන්ට අවශ්‍ය ආරක්ෂාවක් සහ එහි සියලු අවශ්‍යතා සපයන පිණිසත්, යාච්ඤා කරන්න.

**ඔක්:17--** ලොව පුරා සිටින සියලු තරුණ පිරිමි ළමුන් සහ ගැහැණු ළමුන් දෙවියන්වහන්සේ සමග ඉතා සමීප සම්බන්ධතාවයක් ඇති කරගන්නා පිණිස සහ උන්වහන්සේගේ වචනයට අනුව ජීවත් වන පිණිස, යාච්ඤා කරන්න.

**ඔක්:18--** සෑම ජාතියකම ආශිර්වාදය ලබා නැගී සිටින පිණිස, විශ්වාසවන්තව මැදිහත් වන තවත් බොහෝ යාච්ඤා රණශූරයින් දෙවියන් වහන්සේ විසින් නැගිටුවනු පිණිස, යාච්ඤා කරන්න.

....Contd. from page 4

යෝවාෂ් දුෂ්ඨ උපදේශකයන්ට ඇහුම්කන් දී ස්වාමීන් වහන්සේගෙන් ඈත් විය. යෙහෝයාදා; ඔහුට අනුගමනය කිරීමට ඉගැන්නූ දෙවියන්වහන්සේව ඔහු අත්හැරියේය.

**දේව වචනය මෙසේ පවසයි;**

*"මෙසේ යෝවාෂ් රජ ඔහුගේ පිය වූ යෙහෝයාදා තමාට කළ කරුණාව සිහි නොකොට ....." (2ලේකම් 24:22)*

ඃ තම ජීවිතය බේරාගත් මිනිසා අමතක විය.
ඃ ඔහුට මග පෙන්වූ උපදේශකයා අමතක විය.
ඃ ඔහුට ආයෝජනය කළ ආත්මික පියා අමතක විය.

මෙය අප සැමටම අනතුරු ඇඟවීමකි.

බොහෝ අය අද ඔවුන් සිටින ස්ථානයේ සිටින්නේ යමෙකු ඔවුන් වෙනුවෙන් ආයෝජනය කළ නිසාය.

දෙමව්පියන්ගේ යාච්ඤාව.
පාලකවරයාගේ ඉගැන්වීම්
මිතුරෙකුගේ දිරිමත් කිරීම.
උපදේශකයෙකුගේ කැපවීම.

නමුත් සාර්ථකත්වය අධ්‍යාත්මික මතක ශක්තිය නැතිකර දැමීමට හැකිය. මිනිසුන් බලපෑමක් ඇති කිරීමට හැකි ස්ථානයකට ළඟා වූ විට, ඔවුන්ට නැගී සිටීමට උදව් කළ අයව අමතක කර දැමිය හැකිය.

**අප මතක තබාගත යුතු**

එක් දෙයක් වන්නේ කිසිවෙක් තනිවම වර්ධනය නොවන බවයි. කෘතඥපූර්වක ඇදහිලිවන්තයෙකු, තම ජීවන ගමනේදී දෙවියන්වහන්සේ විසින් යොදාගත් පුද්ගලයන්ට ගෞරව කරයි.

## අමතක වූ විශ්වාසවන්තකම: නාබල් සහ දාවිත්
## (1 සාමුවෙල් 25)

නාබල් ඉතා ධනවත් මිනිසෙකි. ඔහුට බැටළුවන් සහ එළුවන් දහස් ගණන් සිටියෝය. එසේම ඔහුට සමෘද්ධිය, සම්පත් සහ ආරක්ෂාව තිබුණි. නමුත් ඔහුගේ සාර්ථකත්වය පිටුපස නොපෙනෙන ආශීර්වාදයක් තිබුණි: ආරක්ෂාව.

දාවිත් සහ ඔහුගේ මිනිසුන් පාලු කරයෙහි සිටි කාලයේදී ඔවුන්; නාබල්ගේ එඬේරුන් සහ බැටළු රැළ ආරක්ෂා කළේය. ඔහුගේ දේපළ වටා ආරක්ෂිත පවුරක් මෙන් ඔවුන් සිටියෝය. එසේම ඔවුන් නාබල්ගෙන් අයුතු ප්‍රයෝජන ගත්තේ වත් ඔහුගෙන් සොරකම් කළේවත් නැත.

බැටළුවන්ගේ ලොම් කැපීමේ මංගල්‍යය සඳහා කාලයේ පැමිණි විටදී,
දාවිත් තම සේවකයන් යවා, ආහාර ද්‍රව්‍ය ලබා දෙන මෙන් ඉතා කාරුණිකව ඉල්ලා සිටියේය.

මෙහිදී නාබල් කෘතඥතාවය පළ කරනවා වෙනුවට උඩඟු ලෙස ප්‍රතිචාර දක්වනු ලැබීය. ඔහු දාවිත්ගේ අනන්‍යතාවය පිළිබඳව ප්‍රශ්න කළ අතර දාවිත් සහ ඔහුගේ මිනිසුන් කළ සේවය ප්‍රතික්ෂේප කළේය.

නාබල් ආරක්ෂාව භුක්ති වින්ද නමුත්, ආරක්ෂකයාව අමතක කළේය.

දාවිත්ගේ විශ්වාසවන්තකමින් ඔහු ප්‍රයෝජනය ලැබූ නමුත් එය පිළිගැනීම ප්‍රතික්ෂේප කළේය. මෙය පොදු මිනිස් ප්‍රවණතාවයකි. මිනිසුන් දැනටමත් කර ඇති දේ නොසලකා හරිමින්, කිරීමට අපොහොසත් වන දේ අප බොහෝවිට දකිමු. අපි යමෙකුගේ කරුණාව ගැන හුරුපුරුදු වී එය අපේක්ෂා කිරීමට පටන් ගනිමු. වරක් අපට පුදුමයට පත් කළ දේ සාමාන්‍ය දෙයක් බවට පත්වෙයි.

පවුල තුළ මෙය අත්විඳිය හැකිය.
සභාව තුළ මෙය අත්විඳිය හැකිය.
මිතුත්වය තුළද මෙය අත් විඳිය හැකිය.

ඃ ස්වාමි පුරුෂයෙකුට තම බිරිඳගේ කැපකිරීම් අමතක විය හැකි අතර බිරිඳටද තම ස්වාමියාගේ කැපකිරීම් අමතක විය හැකිය.
ඃ දරුවන්ට දෙමව්පියන්ගේ කැපවීම අමතක විය හැකිය.
ඃ ඇදහිලිවන්තයින් තමන් සමග සිටි අයගේ යාච්ඤා සහ දිරිගැන්වීම් අමතක කළ හැකිය.

**කෘතඥතාවය සඳහා හිතාමතාම සිහිපත් කිරීම අවශ්‍ය වෙයි.**

අප කවුරුන්ද යන්න සහ අද අප සිටින තැනට ළඟා වීමට අපට උපකාර කළ අය සිහිපත් කිරීමට දෙවියන් වහන්සේ අපට උපකාර කරන සේක.

## 4. අමතක වූ නිදහස ගිඩියොන් සහ ඊශ්‍රායලය!
## (විනිශ්චයකාරයන්ගේ පොත 8)

ගිඩියොන්ගේ කතාව ආරම්භ වූයේ බියෙන්ය. දෙවියන් වහන්සේ ඔහුට කතා කරන විට ඔහු සැඟවී සිටියේය. ඔහු තමා දුර්වල හා නොවැදගත් කෙනෙක් ලෙස දුටුවේය. නමුත් දෙවියන්වහන්සේ ඔහුව දුටුවේ බලවත් රණශූරයකු ලෙසය.

ස්වාමීන්වහන්සේගේ දූතයා ගිඩියොන්ට දර්ශනය වූ විටදී ඔහු මෙසේ පවසනු ලැබීය.

*'......... ධෛර්යමත් බලවත් මනුෂ්‍යය ස්වාමීන් වහන්සේ නුඹ සමග සිටින සේක." (විනිශ්චය කාරයන්ගේ පොත 6:12)*

ගිඩියොන්ගේ කීකරුකම තුළින් දෙවියන්වහන්සේ ඊශ්‍රායල්වරුන්ව මිදියන්වරුන්ගෙන් ගලවා ගත්තේය. මිනිසුන් 300ය දෙනකු පමණක් සිටි ගිඩියොන් බයිබලයේ වාර්තා වී ඇති ශ්‍රේෂ්ඨතම ජයග්‍රහණයන්ගෙන් එකක් අත්විඳිනු ලැබීය.

දෙවියන්වහන්සේ ගිඩියොන් හරහා ක්‍රියා කළ නිසා ජාතිය සාමය භුක්ති වින්දේය.

නමුත් ගිඩියොන්ගේ මරණයෙන් පසු ඊශ්‍රායලය එය ඉතා ඉක්මනින් අමතක කළේය.

දේව වචනය මෙසේ පවසයි:

*"වට කර සිටි තමුන්ගේ සියලු සතුරන්ගේ අත්වලින් තමුන් ගැලෙවූ තමුන්ගේ දෙවි වූ ස්වාමීන්වහන්සේ ඊශ්‍රායෙල් පුත්‍රයන් විසින් සිහි කළේවත් ......" (විනිශ්චයකාරයන්ගේ පොත 8:34)*

ඔවුන් ගිඩියොන්ගේ පවුලට කරුණාව පෙන්වීමටද අසමත් විය.

සෙනග ජයග්‍රහණය සිහිපත් කළ නමුත්, දෙවියන්වහන්සේ ගිඩියොන් හරහා ඔවුන්ට එම ගැලවීම ලබා දුන් බව අමතක කළේය. අප සියලු දෙනාටම මෙය විශාල අනතුරකි.

ගමන අමතක කර ප්‍රතිඵලය සැමරීමට අපට හැකිය. යාච්ඤාවෙන් ලැබුණු පිළිතුරු අපට භුක්ති විඳීමට හැකි අතර; ඒවාට පිළිතුරු දුන් කැනැත්තාව අමතක කර දැමිය හැකිය.

ඊශ්‍රායලයේ විශාලතම ගැටලුව ඔවුන්ට ආශිර්වාද නොමැතිකම නොව; එම ආශිර්වාදවල මූලාශ්‍රය ඔවුන් අමතක කිරීමයි.

සෑම ආශිර්වාදයක්ම අප දෙවියන් වහන්සේට සමීප කළ යුතුය. උන්වහන්සේගෙන් තවත් ඈත් නොවිය යුතුය.

අවාසනාවකට, මෙය වර්තමාන ලෝකයේ ඇති විශාල අභියෝගවලින් එකකි. අප දෙවියන් වහන්සේගෙන් ආශිර්වාද ඉල්ලා සිටිමු. නමුත් සමහර විට අපට ලැබෙන ආශිර්වාද අපව උන්වහන්සේ වෙත සමීප කිරීමට වඩා උන්වහන්සේගෙන් අපව ඈත් කිරීමට පටන් ගනියි.

## 5). අමතක වූ සුව කරන්නා! (ලූක් 17)

සමහර විට අමතක වීමේ බලවත්ම චිත්‍රය ලාදුරු රෝගීන් දස දෙනාගේ කතාවෙන් අභිට සොයා ගතහැකිය. ලාදුරු රෝගය විනාශකාරී රෝගයක් විය. එයින් පීඩා විඳි අය සමාජයෙන් වෙන් කරන ලද අතර සාමාන්‍ය ජීවිතය ගත කිරීමට නොහැකි වූ අතර බොහෝවිට ඔවුන්ව සමාජයෙන් බැහැර කරන ලද අය ලෙස සලකනු ලැබීය.

ලාදුරු රෝගීන් දස දෙනා යේසුස් වහන්සේට මෙසේ ශබ්ද නගා මොරගැසුවෝය:

*“..........යේසුස් වහන්ස, ආචාරීන් වහන්ස අපට කරුණා කළ මැනවය .” (ලූක් 17:13)*

යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔවුන් කෙරෙහි සානුකම්පිතව ඔවුන් සියල්ලන්ව සුවපත් කළේය.

- ★ ජීවිත දසයක් පරිවර්තනය විය
- ★ දස දෙනෙකුට දෙවෙනි අවස්ථාවක් ලැබුණි
- ★ දස දෙනෙක් දෙවියන් වහන්සේගේ බලය අත්වින්දේය
- ★ නමුත් නැවත පැමිණුනේ එක් පුද්ගලයෙක් පමණි.

යේසුස් ක්‍රිස්තුස් වහන්සේ මෙසේ පවසනු ලැබුවේය:

*“........ දසදෙනාම පවිත්‍ර වුණා නොවේද? නුමුත් නව දෙනා කොයිද?” (ලූක් 17:17)*

රෝගීන් නව දෙනාම ආශ්චර්ය අත්වින්ද නුමුත් අශ්චර්යමත් දේ කළා වූ සේවකයාව අමතක විය.

ඔවුන්ට සුවය ලැබුණත් ස්තුති දීම සහ නමස්කාරය සමඟ නැවත පැමිණීමට අපොහොසත් විය. ඔවුන්ගේ ලොකුම පාඩුවක් භෞතික දේ නොව - එය ආත්මිකයි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කළ දේ හඳුනාගෙන එයට ගෞරවය කිරීමේ අවස්ථාව ඔවුන්ට අහිමි විය.

### අපි කොපමණ වාරයක් මෙසේ කරනවද?

අපිට උපකාර අවශ්‍ය වූ විට අප කෑ ගසමු. දුෂ්කරතාවයන්ට මුහුණ දෙන විටදී අප දෙවියන්වහන්සේව සොයමු. අපගේ සැපයීම, සුවය, මගපෙන්වීම සහ ඉදිරි ගමන සඳහා අප යාච්ඤා කරමු.

නමුත් පිළිතුරු ලැබුණු පසු අප ස්තුති දීමට ආපසු යනවාද?

දෙවියන්වහන්සේට අපගේ කෘතඥතාවය අවශ්‍ය නොවේ. නමුත් අපට කෘතඥතාව අවශ්‍ය වේ. මන්ද එය අපගේ හදවත් උන්වහන්සේට සම්බන්ධ කර තබා ගන්නා අතර සෑම ආශිර්වාදයකම උල්පත උන්වහන්සේ බව අපට මතක් කර දෙයි.

## මතකයේ රැඳෙන හදවතක්

බයිබලය නැවත නැවතත් දෙවියන් වහන්සේගේ සෙනගට මතක් කර දෙන්නේ:

- උන්වහන්සේගේ විශ්වාසවන්තකම සිහිකරන්න.
- උන්වහන්සේගේ පොරොන්දු සිහි කරන්න.
- උන්වහන්සේගේ යහපත්කම සිහිකරන්න.
- උන්වහන්සේ අපගේ ජීවිතවල තබා ඇති අයව මතක තබාගන්න.
- සියල්ලටම වඩා අපට ආශිර්වාද කර උපකාර කළාවූ ස්වාමීන්වහන්සේව සිහි කරන්න.

අමතකවීම උදාසීනකමට මග පාදයි. මතකය නමස්කාරයට මග පාදයි. කුසලාන දරන්නා යෝසෙප්ගේ කරුණාව අමතක කළේය.

යෙහෝවාදාගේ මගපෙන්වීම යෝවාෂ් අමතක කළේය. නාබල් දාවිත්ගේ ආරක්ෂාව අමතක කළේය. ඊශ්‍රායලය ගිඩියොන්ගේ ගැලවීම් අමතක කළේය.

ලාදුරු රෝගීන් නව දෙනා යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ දයාව අමතක කළේය.

අප ඔවුන්ගේ වැරදි වලින් ඉගෙන ගනිමු.

මතකය ඇති මිනිසුන් බවට පත්වෙමු.

ඔබ වෙනුවෙන් කැප වූ දෙමව්පියන්ව මතක තබාගන්න!
ඔබව දිරිමත් කළා වූ ගුරුවරයාව මතක තබා ගන්න!
ඔබ අසල සිටි මිතුරාව මතක තබා ගන්න!
ඔබ වෙනුවෙන් යාඥා කළ දෙවියන්වහන්සේගේ සේවකයාව මතක තබා ගන්න!

සියල්ලටම වඩා අපගේ ස්වාමීන් වන ගැලවුම්කාර යේසුස් ක්‍රිස්තුස්වහන්සේව සිහිකරන්න - අප පව්කාරයන්ව සිටියදී අප වෙනුවෙන් මේ ලෝකයට පැමිණ ජීවිතය දුන් තැනැත්තා; කොන්දේසි විරහිතව අපට ප්‍රේම කළ තැනැත්තා; ඔබ සහ මා වෙනුවෙන් මියගොස් නැවත නැගිටුන තැනැත්තා; සහ උන්වහන්සේ සමඟ සදාකාලිකව ජීවත්වීමට අපව රැගෙන යාමට නැවත පැමිණෙන තැනැත්තා.

ලොකුම අනතුර වන්නේ මිනිසුන්; අමතක කිරීම පමණක් නොවේය. ලොකුම අනතුරු නම් දෙවියන්වහන්සේව අමතක කිරීමයි.

දෙවියන්වහන්සේ අපගේ ජීවන ගමනේදී යොදාගත් සෑම යහපත් දීමනාවක්ම සහ සෑම විශ්වාසවන්ත සත්‍යයක්ම හඳුනාගන්නා කෘතඥපූර්වක හදවත්වලින් අපගේ ජීවිත සැමවිටම පිරී තිබේවා.

සෑම ආශිර්වාදයක්ම ගලා එන තැනැත්තාව අප කිසිදා අමතක නොකරමු.

*“මාගේ ආත්මය, ස්වාමීන්ට ප්‍රශංසා කරව, උන්වහන්සේගේ උපකාර සියල්ල සිහි නැති නොකරව.” (ගීතාවලිය 103:2)*

******************

NEHEMIAH BIBLE COLLEGES,
Chepauk & Santhoshapuram, Velachery Chennai.
Rush for admission!
Medium : Tamil (Part Time)
Hindi (Part Time)
Diploma in Theology &
Bachelor of Theology
Qualification :
10th Standard & above
Contact :
Recognised by
International Christian Leaders &
Senior Pastors for the past 57 years
The Chairman, Nehemiah Bible College.
10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA.
Phone : (+91-44) 2852 8282, Cell : (+91) 98410 71852 / 95661 31858
E.mail : sam@echoofhiscall.org / Website : www.echoofhiscall.org



# PIT TO PALACE

## පාලු වළකින් මාලිගාවට

## "...කියවන්නා තේරුම් ගනීවා...." (මතෙව් 24:15)

## අපගේ ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසලේ ඉතිහාසය

"ඒ හැටියට - ඔහු විසිරෙව්වේය, දිළිඳුන්ට දුන්නේය; ඔහුගේ ධර්මිෂ්ටකම සදාකල් පවතින්නේයයි ලියා තිබේ. ඉතින් වපුරන්නාට බීජ ද කෑමට රොටිද සපයා දෙන්නාවූ තැනන් වහන්සේ නුඹලාට වැපිරීම පිණිස බීජ සපයාදී, වැඩිකොට නුඹලාගේ ධර්මිෂ්ටකමේ ඵල වර්ධනය කරන සේක" (2 කොරින්ති 9:9-10)

මීට වසර විසි අටකට පමණ පෙර අපගේ ශාන්ත පාවුළු මෙට්‍රිකියුලේෂන් පාසල දැන් පිහිටා ඇති ගමෙහි බොහෝ දුප්පත් දරුවන්: අරමුණක් නොමැතිව ඉබාගාතේ යන අයුරු මම දුටුවෙමි. මෙම දරුවන්ගෙන් බොහෝ දෙනෙකුට දැඩි දරිද්‍රතාවය නිසා පාසල් ගමන යාමටද නොහැකි විය.

එම කාල පරිච්ඡේදය තුළදී අපගේ තැපැල් මාර්ගික බයිබල් පාඩම් පාඨමාලාවේ පාඩම් භාවිතා කරමින් කෙටිකාලීන තැපැල් මාර්ගික බයිබල් සහතික පත්‍ර පාඨමාලාව කණ්ඩායම් බයිබල් අධ්‍යනයන් පැවැත්වෙමු. 'ඔබට නව ජීවිතය - ඉංග්‍රීසි සහ දෙමළ යන භාෂා දෙකෙන්ම සෑම කණ්ඩායමකම අඩු වරප්‍රසාද ලත් දරුවන් සියයකට ආසන්න සංඛ්‍යාවක් සිටි අතර විවිධ ස්ථානවල එවැනි කණ්ඩායම් රාශියක් තිබුණි. ඔවුන්ගේ පැමිණීම දිරිමත් කිරීම සඳහා අප ඔවුන්ට සත්කාරයෙන් ලබා දුන්නෙමු. ක්‍රමයෙන් දරුවන් සරල ඉංග්‍රීසි වචන සහ ක්‍රිස්තියානි ගීත ඉගෙන ගැනීමට පටන් ගත්තේය. ඔවුන් නිවසේදී මෙම ගීත ගායනා කරන විට ඔවුන්ගේ දෙමව්පියන්ට මහත් ප්‍රීතියක් ගෙනාවේය.



එම අවස්ථාවේදී, මෙම දුප්පත් දරුවන් සඳහා එම ගමෙහි ඉංග්‍රීසි මාධ්‍යයෙන් පාසලක් පිහිටුවීමට ස්වාමීන්වහන්සේ මගේ හදවතට බරක් දැමුවේය.

"මක්නිසාද තමන් වහන්සේගේ යහපත් කැමැත්ත නිසා කැමති වෙන්ටත් වැඩ කරන්ටත් නුඹලා තුළ ක්‍රියා කරන්නේ දෙවියන්වහන්සේමය." (පිලිප්පි 2:13)

ස්වාමීන්වහන්සේ මෙම දර්ශනය තහවුරු කරනු ලැබුයේ එක් අයෙකු හරහාය. මගේ ප්‍රේමණීය මිතුරා, සෑම් ඩැනියෙල් මහතා ඒ අනුව ශාන්ත පාවුළු මෙට්‍රිකෙව්ලේෂන් පාසල ආරම්භ කරන ලදී.

මුල් අවුරුදු වලදී අප ඉතා කාර්ය බහුල කාලයන් සහ බොහෝ අභියෝග වලින් පිරුණු කාලයන් වලට මුහුණ දී තිබුණි. මා තනිවම පාහේ විශාල මූල්‍ය අවශ්‍යතාවයන් වලට මුහුණ දීමට ද සිදුවිය. බොහෝ දෙමව්පියන් තම දරුවන් අපගේ පාසලට ඇතුළත් කරනු ලැබුවද, ගුරුවර කාර්ය මණ්ඩලයේ මාසික වැටුප් පියවා ගැනීමටද නිරන්තර අරගලයක් බවට පත්විය.

කෙසේ වෙතත් එම දුප්පත් දරුවන්ගේ සිනාමුසු මුහුණු, ඉංග්‍රීසියෙන් මට ආචාර කර ප්‍රීතියෙන් ඉංග්‍රීසි ගීතිකා ගායනා කරන ආකාරය දුටු සෑම අවස්ථාවකදීම සියලු දුෂ්කරතා මධ්‍යයේ වුවද දේව සේවය දිගටම කරගෙන යාමට මට තවත් ශක්තිය හා අධිෂ්ඨානය ලැබුණි.





අපගේ අධ්‍යාපන ආධාර වැඩසටහන හරහා අවශ්‍යතා ඇති දරුවන්ගේ අධ්‍යාපනයට අනුග්‍රහය දැක්වීමට හැකිවන පරිදි මා සහ මගේ බිරිඳ මගේ අපගේ පෞද්ගලික වියදම් හැකිතාක් අඩු කළෙමු. තහාගම්දී සහෝදරයන් දෙදෙනෙක් පාසල් ගොඩනැගිලි ඉදිකිරීමට උදව් කළ ද පාසලේ එදිනෙදා කටයුතු සඳහා සහාය වීමට කිසිවෙකු ඉදිරිපත් වූයේ නැත. එහි ප්‍රතිඵලයක් වශයෙන් බොහෝ අවස්ථාවන්වලදී ගුරුවරුන්ගේ සහ කාර්යාලයේ වැටුප් ගෙවීම සඳහා අපගේ පෞද්ගලික දේපළ සහ අපගේ ආභරණ පවා විකිණීමට සිදුවිය.

මීට වසර කීපයකට පෙර රෝහලට ඇතුළත් කර සිටි මිතුරෙකු බැලීමට යාමට මට අවස්ථාවක් ලැබුණි. කෙසේ වෙතත් මම නියමිත වේලාව පසුව එහි පැමිණුනෙමි. එබැවින් මම තරමක් පැකිලීමෙන් යුතුව රෝහල හරහා ඇවිද ගියෙමි. මම කොරිඩෝව දිගේ ගමන් කරමින් සිටින විටදී ප්‍රධාන වෛද්‍යවරයා සමග වෛද්‍යවරු කීප දෙනෙක් මට ප්‍රතිවිරුද්ධ දිශාවෙන් පැමිණියේය. නොදැනුවත්වම දැඩි සත්කාර ඒකකය (ICU) අසල ඔවුන්ගේ මාර්ගයට මුහුණට මුහුණලා සිටින බව මට පෙනුණි. මා හට ලැජ්ජාවක් දැනුණු නිසා මා එහි කෙළවරකට ගොස් 'මට සමාවෙන්න' කියා පැවසුවෙමි.

පුදුමයට කරුණක් නම්, එම වෛද්‍යවරුන්ගෙන් එක් අයෙක් මා වෙතට වේගයෙන් පැමිණ මා ඉදිරියේ දන ගසා මගේ පාද අල්ලාගෙන අඬන්නට විය.

ඔහු මෙසේ පැවසීය,

නොමිලේ අධ්‍යාපනය, නිල ඇඳුම්, ආහාර පාන සහ මා හට අවශ්‍ය සෑම ආධාරයක්ම ලබාදුන්නේය. මා පාසල් ගාස්තු කිසිවක් ගෙව්වේද නැත. ඔබගේ කරුණාව නිසා මට මගේ පාසල් අධ්‍යාපනය සම්පූර්ණ කිරීමට හැකි විය. පසුව මම වෛද්‍ය අධ්‍යාපනය හැදෑරුවෙමි. අද දෙවියන්වහන්සේගේ කරුණාවෙන්

## MAIN CHURCH PROGRAMMES

1. Prayer Service : 24 hours
2. **ECHO OF HIS CALL** - Monthly Magazines :English, Tamil, Malayalam, Telugu, Hindi, Kannada, Marathi, Gujarati, Bengali, Odiya, Nepali, Assamese, Punjabi, Urdu, Sinhala & Afrikaans.
3. **BIBLECOR** - Basic Bible Courses (English, Tamil & Hindi)
4. Theological Correspondence Courses: English & Tamil
5. Nehemiah Bible Colleges (Chepauk, Santhoshapuram & Velachery)
6. Branch Churches: Santhoshapuram, Balaji Nagar & Velachery
7. Great Commission Partners (Network of Pastors)
8. Training Programmes – Seminars & Retreats
9. Crusades
10. Literature Distribution and Follow Up
11. Gospel Printing Press - Publications
12. St. Paul's Matriculation School - Village English High School
13. Sunday Schools (Chepauk) : 10.30 a.m. Sunday & (Velachery, Balaji Nagar & Santhoshapuram) 3.00 p.m. Sunday
14. **Early Morning Service : 5.30 a.m. Sunday**
15. **Preliminary Service : 8.00 a.m. Sunday**
16. **Tamil Service : 8.30 a.m. Sunday**
17. **Children School : 11.00 a.m. Sunday**
18. **Fellowship Lunch : 11.00 p.m. Sunday**
19. **Elders for Christ : 11.00 p.m. Sunday**
20. **Fellowship Lunch : 01.00 p.m. Sunday**
21. **Telugu Service : 4.00 p.m. Sunday**
22. **Hindi Service : 5.00 p.m. Sunday**
23. **Tamil & English Service : 6.00 p.m. Sunday**
24. Feedback Time : 7.30 p.m. Sunday
25. Women's Prayer : 5.30 p.m. Wednesday
26. Men's Prayer : 7.30 p.m. Friday
27. Discipleship Meeting : 6.00 p.m. Saturday
28. House Meetings : 6.30 p.m. Tuesday & Thursday
29. Special Holy Communion : 6.00 a.m. 1st day of each month
30. Ministers' Meeting : 5.30 p.m. First Saturday
31. Parents' Prayer : 4.00 p.m. First Sunday
32. Night Prayer : 9.30 p.m. Third Friday
33. Fasting Prayer : 9:30 a.m. Second Saturday
34. Holy Communion : Second Sunday Service
35. Youth / Kid Prayer : 10.00 p.m. daily (over phone)
36. Staff Devotion : 9.00 a.m. daily
37. Office : 9.00 a.m. to 9.00 p.m. (except Sundays)

මම වෛද්‍යවරයෙක් වෙමි. මගේ පාසල් කාලය තුළදී මට ලැබුණු අධ්‍යාත්මික පදනම මගේ ජීවිතයට මග පෙන්වූ අතර දැන් මම මගේ සෙසු වෛද්‍යවරුන් සමග ශුභාරංචිය බෙදානිමි.

පැමිණ සිටි සියල්ලලෝම දැඩි ලෙස සංවේගයට පත්විය. තරුණයාගේ ජීවිතය තුළ දෙවියන් වහන්සේ කළ අපූරු ක්‍රියාව නිසා අප මවිතයට පත්වුනෙමු. වෛද්‍යවරුන් මට ඉතා ගෞරවයෙන් සැලකුව නුමුත් එම සියලු ගෞරවය හා මහිමය දෙවියන් වහන්සේටම පමණක් හිමි විය යුතුය.
අපගේ පාසල හරහා මෙවැනි තවත් බොහෝ සාක්ෂි තිබේ. සර්වබලධාරී ස්වාමීන් වහන්සේ කෙරෙහි තිබෙන නොසැලෙන ඇදහිල්ල තුළින් පමණක් අපිට මෙම සේවය දිගටම පවත්වාගෙන යාමට හැකිවී තිබේ.



Posted at "Egmore RMS Patrika Channel" RNI NO. TN/SIH/2006/17846

අද වන විට ශාන්ත පාවුළු මෙට්‍රික්‍යුලේෂන් පාසලේ සිසුන් 500කට වඩා වැඩි පිරිසක් ඉගෙනුම ලබති. ප්‍රදේශයේ ඇති සියලුම පාසල් අතරින් අපගේ පාසල ඉතා හොඳම පාසල සඳහා වන සම්මානය ලබා ගැනීමටද තෝරා ගන්නා ලද අතර එය 2008 දෙසැම්බර් මස 24 වන දින හිටපු ආහාර අමාත්‍යවරයා ඉදිරියෙහි හිටපු අධ්‍යාපන අමාත්‍යවරයා විසින් පිරිනමන ලදී.

අපගේ යාච්ඤාව නම්, මෙම දේව සේවය තුළින් දෙවියන්වහන්සේ තවත් බොහෝ ජීවිත පරිවර්තනය කරනු ඇත යන්නයි. දරුවන් අන්ත දරිද්‍රතාවයේ සහ බලාපොරොත්තු සුන්වීමේ අගාධයේ සිට බලාපොරොත්තුව, අරමුණ සහ ආශිර්වාදය පිරි ජීවිතයක් කරා රැගෙන යමු.

"මක්නිසාද මම බඩගිනිව සිටියෙමි, නුඹලා මට කන්ට දුන්නහුය. පිපාසිතව සිටියෙමි, නුඹලා මට බොන්ට දුන්නහුය. ආගන්තුකව සිටියෙමි නුඹලා මා පිළිගත්තහු ය; වස්ත්‍ර නැතුව සිටියෙමි නුඹලා මට ඇඳුම් දුන්නහුය ......"

එකල ධර්මිෂ්ඨයන් උත්තර දෙමින්; ස්වාමීනි, කොයි කලෙක ඔබවහන්සේ බඩගිනිව සිටිනවා දැක කෑම දුනිමුද? නොහොත් පිපාසිතව සිටිනවා දැක බොන්ට දුනිමුද? කොයි කලෙක ඔබවහන්සේ ආගන්තුකව සිටිනවා දැක පිළිගතිමුද? නොහොත් වස්ත්‍ර නැතුව සිටිනවා දැක ඇඳුම් දුනිමුද?"

එවිට රජ්ජුරුවෝ උත්තර දෙමින්: සැබැවක් නුඹලාට කියමි - මාගේ මේ සහෝදරයන්ගෙන් ඉතා කුඩා කෙනෙකුට නුමුත් නුඹලා ඒක කළහුද ඒක කළේ මටයයි කියන සේක." (මතෙව් 25:35-40)

*************

**NOTICE**

Save our mobile numbers (+91) 98410 71858, (+91) 98412 71858 (main numbers) in your mobile phones. - Editor

# ECHO OF HIS CALL

Monthly magazines in 16 languages, Bible Colleges, Postal Courses, Church Planting, Village English High School, Gospel Printing Press, Crusades, Seminars, Social Services, etc.

Annual Subscription : Rs. 100/- Life Subscription : Rs. 2000/-

The multifarious activities of **Echo of His Call Ministries** are supported by the free-will offerings and donations of God's children like you. You may support **Echo of His Call** and its activities as the Lord leads you. We need your help to send forth the Gospel to the unreached people and plant Churches.

If you would like to receive **ECHO OF HIS CALL** magazines regularly, please write to us with your e.mail Id and Cell Phone number. Whenever you change your postal or e.mail addresses, please do inform us your old and new addresses.

**Echo of His Call** is available in 16 languages in our website also. You can read them by going into the site as well as downloading them and get blessed.

Your letters, prayer requests and your financial helps (**Money Orders, Cheques or Demand Drafts, NEFT, PayPal (Sam Selva Raj, sam@echoofhiscall.org) PhonePe (98410 71858), Gpay (98410 71858), Western Union, MoneyGram, etc.**) to **ECHO OF HIS CALL** may please be sent to the address below.

Please send your **Land Phone / Mobile Phone Numbers and E.mail addresses** for updation.

Our address :

ECHO OF HIS CALL

10, MOHAMMED ABDULLAH 2ND STREET, CHEPAUK, CHENNAI - 600 005, INDIA

PH.: (+91-44) 2852 8282, 2852 9293, 2854 7766/ Cell: (+91) 98410 71852, 95661 31858 / E.mails: sam@echoofhiscall.org / biblecor@yahoo.co.in

Websites: www.echoofhiscall.org / www.stpaulsmatriculation.org

**Regd. with the Registrar of Newspapers for India under No. TN/SIH/2006/17846**

**Date of Publication: First week of every month**

**Date of Posting : 1st & 2nd of every month**

**Posted at "Egmore RMS Patrika Channel"**

**on 2nd SEPTEMBER 2026.**

**If un-delivered please return to:**

**ECHO OF HIS CALL (SINHALA)**

**P.O. Box No. 2957,**

**Chepauk, Chennai - 600 005, INDIA.**

**Phone: (+ 91- 44) 2852 8282, 2852 9293, 2854 7766**

***JESUS LOVES YOU!***

To

***GOD BLESS YOU!***

Owned and published by **S. Sam Selva Raj** from New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005 and printed by **S. Sam Selva Raj** at **Echo of His Call Printers,** New No. 8 & 10, Old No.18 & 19, Mohammed Abdullah 2nd Street, Chepauk, Chennai-600 005. Editor: **S. Sam Selva Raj.**